# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 පෙබරවාරි මස 06 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.02.06 දින නිකුත් කරන ලදී)


# මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ)

**(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)**

**මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 58.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය
# (සංස්ථාගත කිරීමේ)

## මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

*පූර්විකාව*

“ මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය ” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව. එහි පර්මාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ සියලු කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී මධ්‍යස්ථානය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී මධ්‍යස්ථානය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින්ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මෙම පනත 2026 අංක  දරන මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම*

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින්මතු “ මධ්‍යස්ථානය ” ලෙස හඳුන්වනු ලබන) දැනට මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු “ සංස්ථාපිත මණ්ඩලය ” යනුවෙන් සඳහන් කරනු ලබන) “මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය” යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධවද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු

මුද්‍රාවක් ලබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ හා ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරිය ඊට ඇත්තේ ය.

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන අතර, මෙම පනතේ ප්‍රතිපාදන ඊට අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** (1) යම් ලිඛිත නීතියක ප්‍රතිපාදනයන්ට යටත්ව සංස්ථාපිත මණ්ඩලය පිහිටුවීමේ පොදු පරමාර්ථ වන්නේ-

(අ) අරමුණු සහ අනාගත රැකියා අවස්ථා වලට මුහුණ දීමට යෞවන යෞවනියන් වඩාත් හොඳින් සූදානම් කිරීමට ඉගෙනීම සහ නිපුණතා වර්ධන වැඩසටහන් මෙහෙය වීම;

(ආ) තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම;

(ඇ) දුෂ්කර ප්‍රදේශවල ජීවත්වන යෞවන යෞවනියන් සඳහා තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවාවන් ලබා දීම සහ/ හෝ පිළියෙල කිරීම; සහ

(ඈ) නිපුණතා සහ ඉගෙනීම වර්ධනය කිරීමට කලින් කලට අවශ්‍ය වැඩසටහන් මෙහෙයවීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේදී එහි පොදු පරමාර්ථ ජාතිය, කුලය, ආගම, භාෂාව, ස්ත්‍රී-පුරුෂ භේදය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙන යම් හේතුවක් මත පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලය විසින් වග බලා ගත යුතු ය.

රජයේ හෝ පළාත් සභාවේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ අතර ගැටුම් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

**4.** රජයේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වා ගෙන යනු ලබන යම් කාර්යයන් සහ සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය අතර කිසිඳු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සහ අනුකූලවන / අදාළ නීති යටතේ අවශ්‍ය අනුමතයන් යටතේ/ සමග සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය

**5.** (1) මේ පනතේ විධිවිධාන වලට සහ 7වන වගන්තිය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ධූර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ධූර දරන සාමාජිකයන් විසින් (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව, (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව ඇතුළත සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් දක්වා ඇති ආකාරයට සංස්ථාපිත මණ්ඩලයේ පළමු මණ්ඩලය පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ දින තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයක් වශයෙන් කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා රීති සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයට බලය ඇත්තේ ය.

(ඇ) යම් රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක් විසින් අතුරු මණ්ඩලයේ යම් තීරණයක් ගනු ලැබිය යුතු ය; සහ

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ පළමු මණ්ඩලය පත් කරනු ලැබීම හෝ තෝරා පත් කරනු ලැබීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ද ඇතුලුව මණ්ඩලයේ සෑම ධුර දරන්නෙක්ව අවුරුදු තුනක කාලයක් සඳහා පත් කර ගත යුතු හෝ තෝරා පත් කර ගත යුතු අතර, එම අවුරුදු තුනක කාල සීමාව ඉකුත්වීමෙන් පසුව එම ධුර දරන්නා, අනුශාසකවරයා සුදුස්සකු විය යුතු ය; හෝ උපදේශකවරයා නැවත පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සෙකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, යම් අශක්නුතාවයකට පත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවකදී සංස්ථාපිත මණ්ඩල විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත් කර ගැනීම හෝ පත් කර ගැනීම කළ යුතු ය.

(4) මෙම පනතේ විධිවිධානවලට යටත්ව කලින් කලට අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණ මත-

(අ) සාමාජිකත්වය සඳහා සුදුසු යම් පුද්ගලයෙක් බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන නිර්ණායක සම්බන්ධව;

(ආ) සාමාජිකයන්ගේ විවිධ පන්ති / කොටස්වලට (ගෞරවනීය සාමාජිකයන් ද ඇතුළත්ව) වෙන් කිරීම සම්බන්ධව;

(ඇ) සාමාජිකයන්ගේ ඡන්දය ලබා දීමක් වෙතොත් එයට ඇති අයිතිය ද ඇතුළත්ව අයිතිවාසිකම් සහ වගකීම් සම්බන්ධව;

(ඈ) සාමාජිකත්වය අවසන් වන තත්ත්වයන් සහ අවසන් වන්නේ කෙසේ ද යන්න සම්බන්ධව

තීරණ ගත යුතු ය.

(5) අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙක් සංස්ථාපිත මණ්ඩලයේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ ඕනෑම කාර්යාලයක ගෙවීම් සිදු කරන මධ්‍යස්ථානය මගින් වැටුප් හෝ වෙනත් මූල්‍යමය වාසි මධ්‍යස්ථානය වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම හැර අධ්‍යක්ෂක මණ්ඩලවල සාමාජිකයන් වෙත ලබාදෙන කිසිදු තනතුරකට පත්කිරීම හෝ තෝරා ගැනීම සිදු නොකළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කුමන හෝ යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කිරීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ යෝග්‍ය සියළු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට ඇත්තේ ය:-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිළදී ගැනීම, කුලියට ගැනීම, ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලය විසින් සෘජුවම හෝ යම් නිළධාරියෙකු හරහා හෝ ඒ වෙනුවට බලය ලබාදුන් යම් අනුයෝජිතයෙකු විසින් හෝ සංස්ථාපිත මණ්ඩලයේ පර්මාර්ථ ලඟා කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි සියලුම කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට එළඹීම සහ ඒවා ඉටු කර ගැනීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව අරමුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍ය වලින් දේශීය හෝ විදේශීය මූලාශ්‍රයන්ගෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය විසින් ලබාගනු ලබන හෝ සංස්ථාපිත මණ්ඩලයට දෙනු ලබන සියලුම විදේශීය අරමුදල් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළහැකි සාධන පත් සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට,වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට,විකිණීමට සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යානුකූල භාරයක් හෝ යම් වාස්තව දේපලක් හෝ පෞද්ගලික දේපලක් භාරගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ අනෙකුත් සේවා නියුක්තයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම, හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප් සහ දීමනා ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශනා, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ පවතින අනෙකුත් දේශීය හා විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පවත්වා ගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුළ වෙසෙන සේවකයන් පුහුණු කිරීම; සහ

(ඔ) මෙම සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම පනතේ බලය ලබාදී ඇති සියලුම කටයුතු සිදු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති පහත දැක්වෙන කාරණා සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේය:-

(අ) සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධාරීන්ගේ සහ අනෙකුත් සේවා නියුක්තයන් පත් කිරීමේ නියමයන් සහ කොන්දේසි, ඔවුන්ගේ බලතල, කර්තව්‍ය සහ කාර්ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ හා මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේදී හා පැවැත්වීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) මණ්ඩලයේ හා සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයෙකු වීම සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් පිළිබඳව;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ වලට සමාන අරමුණු ඇති දේශීය හා විදේශීය ආයතන සමග සම්බන්ධීකරණය සහ එක්ව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ කාර්ය පටිපාටිය; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක් මෙම වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයට සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ ඉවත් කිරීම සිදුකළ හැකි ය.

(3) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එහි සඳහන් දින සිට ඒවා ක්‍රියාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද සෑම රීතියක්ම, එම රීති ගැසට් නිවේදනයේ පළ කරනු ලැබූ දින සිට මාස 3ක් ඇතුළත අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ පාර්ලිමේන්තුව මගින් අනුමත නොකරන ලද යම් රීතියක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) 4 වන උපවගන්තිය යටතේ පරිඡින්න වූ ලෙස සලකන යම් රීතියක් එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පල කරනු ලැබිය යුතු ය.

(6) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම විටම සංස්ථාපිත මණ්ඩලයේ රීති වලට යටත් විය යුතු ය.

**සාමාජිකයන්ගේ නාම ලේඛනය**

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජිකයන්ගේ නාම ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වා ගෙන යා යුතු ය.

**සංස්ථාවේ අරමුදල්**

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහිම අරමුදලක් පැවතිය යුතු ය.

(2) 6 (ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය, කර්තව්‍ය සහ බැඳීම් ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**ගිණුම් තැබීම සහ විගණනය**

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වසරක් විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලුම ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පවත්වා ගෙන යා යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයෙක් විසින් වාර්ෂිකව විගණනය කර සහතික කළ යුතු ය.

(4) මෙම වගන්තියේ කාර්යයන් සඳහා “සුදුසුකම්ලත් විගණකවරයෙක්” යනු -

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයකු හෝ නීතිය මගින් ස්ථාපිත වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයෙකු වූ ද ගණකාධිකාරිවරයකු ලෙස වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් සංණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයෙකු වූ ද, ගණකාධිකාරිවරයෙකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

**වාර්ෂික වාර්තාව**

**11.** (1) මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සහ 10 වන වගන්තියේ සඳහන් විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයෙකු විසින් සහතික කරන ලද සංස්ථාවේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳ ලැයිස්තුවක් ද සමඟ, අදාළ වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා, සංවිධාන වල රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළදී, සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් සහ සංස්ථාපිත මණ්ඩලය විසින් එළඹෙන ලද සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් වල විස්තර සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද

සංස්ථාපිත මණ්ඩලයේ රීති (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු සහ මධ්‍යස්ථානයට අය විය යුතු ණය

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංස්ථාපිත මණ්ඩලයට අය විය යුතු සියලු ණය සහ සංස්ථාපිත මණ්ඩලයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය මඟින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව

**13.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතු වන චංචල හෝ නිශ්චල යම් දේපලක් අත් කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීති වලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපල අදාළ කර ගැනීම

**14.** කවරාකාරයකින් හෝ ලබාගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ, සංස්ථාපිතමණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කිසිදු කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා, ලාභ වශයෙන් හෝ කෙසේ හෝ අන්‍යාකාරයෙන් ඍජුව හෝ වක්‍රාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතුය. එසේ වුවද, සත්භාවයෙන් සාධාරණව සහ නිසි ලෙස සංස්ථාපිතමණ්ඩලයේ නිලධාරියෙකුට හෝ සේවකයෙකුට හෝ සංස්ථාපිත මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සංස්ථාපිත මණ්ඩලය වෙත සත්‍ය වශයෙන්ම ලබාදී ඇති යම්කිසි සේවාවක් වෙනුවෙන් වේතනයක් ගෙවීම මෙයින් වළකනු නොලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**15.** (1) අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුගේ ඉදිරිපිට හෝ එක් සාමාජිකයකු හා ලේකම් ඉදිරිපිට හෝ එක් සාමාජිකයකු හා මණ්ඩලය විසින් පත් කරන ලද වෙනත් අයකු ඉදිරිපිට මිස සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතුය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තෙකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අධ්‍යක්ෂක මණ්ඩලයේ යම් ධුර දරන්නෙකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරි වන දේපල

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේදී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපලක් ඉතිරිවී තිබුණ හොත්. ඒ දේපල සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) 1 වන උපවගන්තියේ කාර්යය සඳහා උචිත ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුවම, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සභාවේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබීය යුතු ය.

(3) එවැනි ආයතනයක් හෝ ආයතන තීරණය කිරීමකදී 1වන උපවගන්තියට අනුකූලව සිදුකළ නොහැකි වන අවස්ථාවක 2 වන උපවගන්තියට අනුකූලව සාමාජිකයන් විසින් තීරණය කරනු ලබන යම් පුණ්‍ය අරමුණකට එලෙස ඉතිරි වූ දේපළ භාවිත කළ යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**18.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨයන් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.